# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

## වෛද්‍ය පීඨය

01. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I/ II ශ්‍රේණිය**

i. ඉල්ලුම්කරුවන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 තනතුරු අංක 01 හි ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් හෝ MD/MS උපාධිය සමඟ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිරිනමනු ලබන මණ්ඩල සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබිය යුතය. .

හෝ

ආ. (i) අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

සහ

iii. අ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර එකොළහක (11) ක පළපුරුද්ද (ඉහත (ii) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද තිබිය යුතුය.)

ආ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර II ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද

අ. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම
ආ. වෘත්තීය පළපුරුද්ද
ඇ. පිළිගත් ආයතනයක සිදුකරන ලද පර්යේෂණ
ඈ. පශ්චාත් උපාධි අධ්‍යයන

සටහන්/ විශේෂ සටහන් සඳහා 1997.11.21 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 06 වෙත යොමුවන්න.

02. **කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර**

i. ඉල්ලුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 තනතුරු අංක 01 හි (1) හෝ (2) කාණ්ඩය පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. MD/MS උපාධිය සමඟින් පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය මඟින් පිරිනමනු ලබන මණ්ඩල සහතිකය අපේක්ෂිත හෝ පශ්චාත් උපාධි පාඨමාලාවක් (කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2016 හි 3 (අ) (ii) හි නියම කොට ඇති හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් සහිත වීම.

සටහන්/ විශේෂ සටහන් සඳහා 2018.08.02 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2018 හි තනතුරු අංක 3(a) වෙත යොමුවන්න.

### 03. කථිකාචාර්ය (පරිවාස) තනතුර

i. ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය විද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙල) සාමාර්තයක් සහිත වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ අවම වශයෙන් ඉගැන්වීමේ/ පර්යේෂණ/ වෘත්තීය/ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල වසර එකක (01) පළපුරුද්ද

හෝ

ii. ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය විද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ (පහළ පෙල) සාමාර්තයක් සහිත වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ අවම වශයෙන් ඉගැන්වීමේ/ පර්යේෂණ/ වෘත්තීය/ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල වසර එකක (01) පළපුරුද්ද

හෝ

iii. වෛද්‍ය විද්‍යා උපාධියක් සහ වර්ෂ 2කට නොඅඩු, නිබන්ධන/පර්යේෂණ නිබන්ධන සමඟ පර්යේෂණ අංගයක් සහිත පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

සහ

iv. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරනු ලබන අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

### වැටුප් පරිමාණ

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර
:- U-AC 3 (I) Rs. 91,310 - 7x2,170 – 106,500 p.m. + (189% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර
- U-AC 3 (II) Rs. 79,360 - 11x1,630 – 97,290 p.m. +(189% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

03. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර
:- U-AC 3 (III) Rs. 69,580 - 5x1,630 – 77,730 p.m. + (164% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

04. කථිකාචාර්ය (පරිවාස) තනතුර
:- U-AC 3 (Iv) Rs. 54,600 - 10x1,335 – 67,950 p.m. + (144% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

### විශේෂ සටහන්

01. අංක (ii) හෝ (iii) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා බලනුයේ අංක යටතේ (i) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති නම් හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පත්කිරීමට අසතුටුදායක යැයි තේරීම් කමිටුව තීරණය කරන්නේ නම් පමණකි.

02. අධ්‍යයන තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පුකර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කල යුතුය.

03. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.

### වෙනත් ප්‍රතිලාභ

- සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු
- අධ්‍යන දීමනා සහ පර්යේෂණ දීමනාව
- සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය
- විශ්‍රාම පාරිතෝෂික දීමනාව
- නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්
- වාර්ෂික දිරි දීමනා
- සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය සහ වෙනත් වරප්‍රසාද